# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
## நீர்ப்பாசனத் திணைக்களம்
## IRRIGATION DEPARTMENT
## (HYDROLOGY DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation } 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax } 011-2591125
ලිපිනය / முகவரி / Address } 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ07. / 230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை, கொழும்பு 07,இலங்கை / 230, P.O. Box 1138, Bauddhaloka Mawatha, Colombo 07.
දුරකථනය (පොදු) / தொலைபேசி (பொது) / Telephone (General) } 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெயில் முகவரி / E-mail Address } ddhydrology@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site } www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No. } **HYG/W/1**  ඔබේ අංකය / உமது இல / Your No. }  දිනය / திக / Date } **2021.05.13**

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදනය** **වර්ණය - ඇම්බර්**

**නිල්වලා ගංගා ද්‍රෝණිය සඳහා වූ නිවේදන - අංක 01**

**දිනය :- 2021/05/13** **වේලාව :- ප.ව. 5.00**

නිල්වලා ගංගා ද්‍රෝණියේ ධාරා ප්‍රදේශ වලට ලැබුණු වර්ෂාපතනය මත නිල්වලා ගඟ ජල මට්ටම් සැලකිය යුතු මට්ටමින් ඉහළ යමින් පවතී. තව ද, එම ගංගාවෙහි වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කරනු ලබන පානදුගම ජල මිනුම් ස්ථානයේ ජල මට්ටම් සංසන්දනාත්මකව පහත දැක්වේ.

| **ජල මිනුම් ස්ථානය** | **සුළු ගංවතුර මට්ටම** | **මහ ගංවතුර මට්ටම** | **2021/05/13 දින ප.ව. 5.00 ට පවතින ජල මට්ටම** |
|---|---|---|---|
| පානදුගම ජල මිනුම් ස්ථානය | 6.00 m | 7.50 m | 5.82 m |

එමෙන්ම මෙම ගංගාවෙහි ධාරා ප්‍රදේශවලට මේ වන විට මි.මී. 150 ඉක්මවා වැසි ලැබී ඇති අතර තව දුරටත් රාත්‍රී කාලයේද වැසි ඇතිවිය හැකි බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනතුරු ඇඟවීම් අනුව පෙනී යයි. . මෙම තත්වය අනුව නිල්වලා ගංගා ද්‍රෝණියේ ගංවතුර සම්බන්ධයෙන් **ඉදිරි පැය කිහිපය තුළ** පහත සඳහන් ප්‍රදේශ වල ජනතාව **දැඩි අවධානයකින් පසුවිය යුතු බවට මෙමඟින් අනතුරු අඟවනු ලැබේ.**

පිටබැද්දර, අකුරැස්ස, කද්දුව, මාලිම්බඩ, කඹුරුපිටිය, තිහගොඩ, අතුරලිය යන ප්‍රදේශ වලට සුළු ගං වතුර තත්වයක් ඇතිවිය හැකිය. එබැවින් ප්‍රදේශවල පහත් බිම් වල පදිංචි ජනතාවට හා මාර්ග භාවිතා කරන්නන්ට දැඩි අවධානයෙන් පසුවන ලෙසත් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. එසේම, අකුරැස්ස - කඹුරුපිටිය සහ අකුරැස්ස - සියඹලාගොඩ මාර්ගවල අකුරැස්ස නගරය ආසන්නයේ ඇති සපත්තු පාලම් අසලින් ජලයෙන් යටවීමේ අවධානමක් ඇති බැවින් ඒ හරහා ගමන් ගන්නා වාහන විශේෂයෙන් විමසිලිමත් විය යුතු බව දන්වා සිටිනු ලැබේ.

මේ සම්බන්ධයෙන් අදාල ප්‍රදේශවල මහජනතාවගේ සහ ආපදා කළමනාකරණයට අදාල ආයතන වල අවධානය යොමු විය යුතු බව කාරුණිකව දන්වා සිටිමු.

**ඉංජි. එස්.පී.සී. සුගීශ්වර**

වාරිමාර්ග අධ්‍යක්ෂ ( ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ )